## විශේෂ සටහන 4
# මුදල් ප්‍රතිපත්තිමය වගවීම සහ උද්ධමන ඉලක්ක

### හැඳින්වීම

මහ බැංකුවක් විසින් සිය මුදල් ප්‍රතිපත්ති තීරණ පැහැදිලි කිරීම සහ සාධාරණීකරණය කිරීම මෙන්ම එම තීරණ මගින් පාර්ශ්වකරුවන්හට ඇති කරන බලපෑම පැහැදිලි කිරීම මුදල් ප්‍රතිපත්තිමය වගවීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම සාධාරණීකරණය වැදගත් වන්නේ එමගින් මහ බැංකුව විනිවිදභාවයෙන් යුතුව සහ විශ්වාසදායීව එහි ස්වාධීනත්වය පවත්වා ගැනීම තහවුරු කරන බැවිනි. මහ බැංකුවෙහි වගවීම මගින් එහි තීරණ දේශපාලනික හෝ බාහිර බලපෑම්වලින් තොරව ආර්ථිකය පිළිබඳ තර්කානුකූල හේතු මගින් මෙහෙයවනු ලබන බව සනාථ කරමින්, ජනතාව, ව්‍යාපාර සහ ආයෝජකයින් අතර විශ්වාසය ශක්තිමත් කෙරේ. මෙම විශ්වාසය උද්ධමන අපේක්ෂා මනාව පාලනය කර තබා ගැනීමට සහ උද්ධමනය ස්ථායීව තබා ගැනීමට උපකාරී වේ. එමගින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි විශ්වාසය ශක්තිමත් වේ. අනෙක් අතට, උද්ධමනකාරී අවදානම්වලට සහ ආර්ථික අස්ථාවරත්වයට හේතු වෙමින් දුර්වල වගවීමේ රාමුවක් මගින් විශ්වාසය අඩු විය හැකිය.

ඵලදායී වගවීමේ පියවර අතර පැහැදිලි අධීක්ෂණය, විනිවිදභාවය සහ කාර්යසාධන ඇගයීම ඇතුළත් වේ. ප්‍රතිඵල කෙරෙහි බලපාන බාහිර සාධක සමඟ, ආර්ථිකයේ ඉදිරි දැක්ම සහ මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා හේතු පිළිබඳ වාර්තා ප්‍රකාශයට පත් කිරීමට මහ බැංකුවලට නිරන්තරයෙන් අවශ්‍ය වේ. මහ බැංකුවල ඉහළ වගවීම හේතුවෙන් ඒවායේ පරිපාලන විධිවිධාන, ප්‍රතිපත්ති, මෙහෙයුම් සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ අන්තර්ක්‍රියා වැඩිදියුණු වේ. මේ සම්බන්ධයෙන් වූ පර්යේෂණවලින් පෙනී යන්නේ වගවීම සහ විනිවිදභාවයෙන් යුතු මහ බැංකු ඇති රටවල සාමාන්‍යයෙන් අඩු සහ ස්ථායී උද්ධමන අනුපාතික සහිතව වඩා හොඳ ආර්ථික කාර්යසාධනයක් පවත්වාගෙන ඇති බවයි (Mishkin, 1997). කෙසේ වෙතත්, අතිශයින් විමර්ශනශීලී වීමද ඇතැම් විට තීරණ ගැනීම මන්දගාමී වීමට හෝ අධික ලෙස ප්‍රවේශම් සහගත හැසිරීමකට හේතු විය හැකි අතර, එමගින් ආර්ථික අර්බුදවල දී මහ බැංකුවකට තීරණාත්මක නමුත් අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා බාධා ඇති කරයි (Goodhart, 2010).

මහ බැංකු ස්වාධීනත්වය සහ ඉහළ වගවීම එකිනෙක අතර සහජයෙන් ම බැඳී පවතී (Adrian and Khan, 2019). නිවැරදි මුදල් ප්‍රතිපත්තියක් සඳහා පදනම සපයන්නා වූ විනිවිදභාවය සහ වගවීම මහ බැංකුවේ ස්වාධීනත්වය සඳහා පූර්ව අවශ්‍යතා වේ. මහ බැංකු විසින් වාර්තා ප්‍රකාශයට පත් කිරීම හෝ නීතිමය ආයතන වෙත පැහැදිලි කිරීම් හරහා රජයට, මහජනතාවට සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදකයින්ට තම තීරණ පිළිබඳ තොරතුරු නිතිපතා සැපයීම තුළින් විනිවිදභාවය ඇතිවනු ඇත.

### උද්ධමන ඉලක්ක මග හැරීම්වල දී මහ බැංකු වගවීමේ වැදගත්කම

උද්ධමන ඉලක්කකරණය යනු මහ බැංකුවකට නිශ්චිත කාල සීමාවක් තුළ ළඟා කර ගත යුතු නිශ්චිත උද්ධමන ඉලක්කයක් ලබා දෙනු ලබන මුදල් ප්‍රතිපත්ති රාමුවකි. ප්‍රධාන වශයෙන් ම, සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික සකස් කිරීම හරහා, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් මහ බැංකු උද්ධමනය ඉලක්කගත මට්ටමක තබා ගැනීමට උත්සාහ කරන අතර, එමගින් අවිනිශ්චිතතා අඩු කර ආර්ථික උච්චාවචනයන් අවම කෙරේ. කෙසේ වෙතත්, මහ බැංකුවලට සෑම විටම එකඟ වූ ඉලක්කගත මට්ටම් තුළ උද්ධමනය පවත්වා ගැනීමට නොහැකි වේ. මෙය පරිපාලිත මිල සංශෝධන සහ දේශීය සාධකවලින් හෝ ගෝලීය වශයෙන් පැන නගින සැපයුම් අංශයෙහි අවහිරතා ඇතුළු විවිධ හේතු නිසා සිදු විය හැකිය. විශේෂයෙන් ම, උද්ධමනය එහි ඉලක්කයෙන් අපගමනය වන විට, මහජන විශ්වාසය වැඩි කිරීම සහ උද්ධමනය එහි ඉලක්කගත මට්ටමට නැවත ගෙන ඒම සඳහා ශක්තිමත් වගවීමක් අත්‍යවශ්‍ය වේ. මහ බැංකු විසින් අපගමනයට හේතු පැහැදිලි කළ යුතු මෙන්ම, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතු අතර, සිය ප්‍රතිපත්ති තීරණවල විනිවිදභාවය පවත්වා ගත යුතුය. මහ බැංකුවලට තම කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු කරමින් වෙනස්කම්වලට ඉක්මනින් හා කාර්යක්ෂමව අනුවර්තනය වීමට ඇති හැකියාව සහතික කරමින්, මෙම ක්‍රියාවන්ට මග පෙන්වීම සඳහා නීතිමය රාමු බොහෝ විට ක්‍රියාත්මක වේ (Adrian and Khan, 2019).

උද්ධමනය ඉලක්කගත මට්ටම්වලින් අපගමනය වීමට හේතු තේරුම් ගැනීම මහ බැංකු සහ රජයන්ට ස්ථාවරත්වය නැවත ලබා ගැනීම සඳහා වඩා හොඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට උපකාරී වේ. වෙනත් රටවල පෙර අත්දැකීම් සලකා බැලීමේ දී, තෙල් මිල ඉහළ යෑම, සැපයුම් දාම අවහිරතා සහ ගෝලීය අවිනිශ්චිතතා වැනි බාහිර කම්පන උද්ධමනය එහි ඉලක්කයෙන් අපගමනය වීම සඳහා වන පොදු හේතු සාධක වන නමුත්, එය දේශීය සාධක නිසා ද සිදුවිය හැකිය. උදාහරණයක් ලෙස, කැනඩා මහ බැංකුව 2008 වසරේ දී උද්ධමනය ඉහළ යෑමට ප්‍රධාන හේතුව ලෙස වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම සඳහන් කර ඇති අතර උද්ධමනය පාලනය කෙරෙහි ගෝලීය මූල්‍ය අර්බුදයේ බලපෑම් පිළිබඳව සඳහන් කර ඇත (Bank of Canada, 2008). ඒ හා සමානව, නවසීලන්ත සංචිත බැංකුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී අය කරනු ලබන බදු ඉහළ යෑම ඇතුළු සැපයුම් අංශයෙහි සාධක මගින් 2011 වසරේ දී උද්ධමනය ඉහළ යෑමට හේතු පැහැදිලි කළ අතර, භූමිකම්පාවකින් පසුව එය උද්ධමනය කෙරෙහි කෙසේ බලපානු ඇත්දැයි අපේක්ෂා කළ ආකාරය තවදුරටත් පැහැදිලි කළේය (Reserve Bank of New Zealand, 2011). චෙක් ජාතික බැංකුව වැනි ඇතැම් මහ බැංකු, සැලකිය යුතු ආර්ථික කම්පනවලට මුහුණ දෙන විට ඔවුන්ගේ විධිවිධානයන්ගෙන් තාවකාලිකව ඉවතැන් වීමට පවා ඉඩ හරී (Rusnok, 2018). එපමණක් නොව, බොහෝ විට, සංවර්ධිත

ආර්ථිකයන්ට වඩා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි විශාල හා නිරන්තර සැපයුම් කම්පන ඇති වේ. එබැවින්, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි අදාළ ඉලක්කවලින් උද්ධමනය අපගමනය වීම් සඳහා සැපයුමට අදාළ සාධක බහුල වශයෙන් හේතු විය හැකිය.

උද්ධමනය ඉලක්කයට නැවත පැමිණීමේ වේගය ආර්ථික තත්ත්වය සහ ගනු ලබන ප්‍රතිපත්තිමය පියවරවල ඵලදායීතාවය මත රඳා පවතී. උදාහරණයක් ලෙස, පොලී අනුපාතිකවල වෙනස්කම් උද්ධමනයට බලපෑම් කිරීමට සාමාන්‍යයෙන් මාස 18ත් 24ත් අතර කාලයක් ගත වන බව පර්යේෂකයන් සොයාගෙන ඇත. රටක ආර්ථික හා මූල්‍ය වෙළඳපොළ තත්ත්වය අනුව මෙම කාලය මෙයට වඩා දිගු හෝ කෙටි විය හැකිය. විශේෂයෙන් සැපයුම් අංශයෙහි සාධක මගින් උද්ධමනය මෙහෙයවනු ලබන විට, ද්‍රවශීලතා කළමනාකරණය සහ ඉදිරි ප්‍රතිපත්ති මග පෙන්වීම වැනි අතිරේක මෙවලම් භාවිතා කිරීමට ද මහ බැංකු සූදානම් විය යුතුය. සැපයුම් අංශයෙහි සාධක විශේෂයෙන් සැලකූ විට ඇතැම් රජයේ ප්‍රතිපත්ති ද උද්ධමන කළමනාකරණයට සහාය වේ. බදු පැනවීම සහ පරිපාලන මිල ගණන් වැනි කෙටි කාලීන ප්‍රතිපත්ති මෙන්ම කාලගුණය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා වන දිගු කාලීන ප්‍රතිපත්ති ආහාර හා බලශක්ති උද්ධමනයේ තාවකාලික විචලනයන් පාලනය කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, සැපයුම් අංශයේ ගැටලු සාමාන්‍යයෙන් තාවකාලික වන අතර කාලයත් සමඟ ස්වභාවයෙන්ම නිවැරදි වන බව ද සැලකිල්ලට ගත යුතුය. අනෙක් අතට, උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම අඛණ්ඩව පවතින්නේ නම්, එවැනි අපගමන සඳහා හේතු කුමක් වුවත්, උද්ධමන අපේක්ෂා නැවත පාලනය කර ගැනීමට සහ හැකි ඉක්මනින් උද්ධමනය ඉලක්කගත මට්ටම් කරා ගෙන ඒමට මහ බැංකු කටයුතු කළ යුතුය. ඒ අනුව, විවිධ ආර්ථික පාර්ශ්වකරුවන් ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ දී මහ බැංකු සන්නිවේදනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

### 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ මුදල් ප්‍රතිපත්ති වගවීම සම්බන්ධව පවතින විධිවිධාන

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මහ බැංකුව සඳහා ඉහළ මුදල් ප්‍රතිපත්තිමය වගවීමක් මෙන්ම මෙහෙයුම් ස්වාධීනත්වයක් ද සපයයි. මහ බැංකු පනතෙහි 26 වන වගන්තියේ සඳහන් පරිදි මහ බැංකුව විසින් සපුරා ගත යුතු උද්ධමන ඉලක්කය පිළිබඳ මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමක් අත්සන් කළ යුතුය. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ කාර්තුමය සාමාන්‍ය උද්ධමනය අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා 5%ක උද්ධමන ඉලක්කයට ආසන්න ආන්තිකයක් (ප්‍රතිශතාංක ± 2) තුළ පවත්වා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව මහජනතාවට ද ලබා ගත හැකි විය යුතු අතර, අපගමනයට හේතු පැහැදිලි කිරීම, මහ බැංකුව විසින් ගත යුතු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ උද්ධමනය ඉලක්කගත පරාසයට නැවත ගෙන ඒම සඳහා ගත වන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් එහි ඇතුළත් විය යුතුය. තවද, මහ බැංකු පනතෙහි 27 වන වගන්තියට අනුව, උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා, උද්ධමනය සඳහා හේතු වූ සාධක සහ උද්ධමනය සඳහා මැදි කාලීන පුරෝකථන සහ එවැනි පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් පැහැදිලි කරමින්, මහ බැංකුව විසින් මාස හයකට වරක් වාර්තාවක් ප්‍රකාශයට පත් කළ යුතුය. ඊට අමතරව, මහ බැංකු පනතෙහි 80 වන වගන්තිය යටතේ, මහ බැංකුව අවම වශයෙන් සෑම මාස හයකට වරක්වත් සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳව මහජනතාව දැනුම්වත් කළ යුතුය. ඉහත 27 වන සහ 80 වන වගන්තිවල අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව, මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම් ස්වාධීනත්වය මහ බැංකුවට ලබා දෙන අතර ම, සිය ක්‍රියාවන් සහ මිල ස්ථායීතා අරමුණ සාක්ෂාත් කර ගැනීම පිළිබඳ වගවිය යුතු බැවින්, මහ බැංකු පනත ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

### මෑත කාලීනව උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම සහ වගවීමේ පියවර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම්

2024 වසරේ දෙවන, තෙවන සහ සිව්වන කාර්තුවල දී ශ්‍රී ලංකාවේ උද්ධමනය, ප්‍රධාන වශයෙන් විදුලිය සහ ඉන්ධන මිල අඩු කිරීම මෙන්ම ආහාර උද්ධමනය පහළ යෑම වැනි සැපයුම් අංශයෙහි සාධක හේතුවෙන් උද්ධමන ඉලක්කයට ප්‍රතිශතාංක දෙකකට වඩා පහළින් පැවතුණි. තවද, ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම ද උද්ධමනය පහළ යෑමට දායක විය. ඒ අනුව, මහ බැංකු පනතේ අවශ්‍යතාවය පරිදි, උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, ඒ සඳහා මහජනතාවට ප්‍රවේශය ලබා දීමටත් මහ බැංකුව කටයුතු කරන ලදී. 2024 වසරේ දෙවන සහ තෙවන කාර්තු සඳහා අදාළ වන එම පළමු වාර්තාව මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර, 2024 වසරේ තෙවන සහ සිව්වන කාර්තු සඳහා අදාළ වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර එය ඉදිරි කාලය තුළ මහජනතාවට ද ලබාගත හැකිවනු ඇත. තවද, ඉහත සඳහන් කළ සාධක ම හේතු වීමෙන් 2025 වසරේ පළමු කාර්තුව තුළ උද්ධමනය, එහි ඉලක්කයට වඩා ප්‍රතිශතාංක දෙකකට වඩා අඩු මට්ටමක පැවති බැවින්, මහ බැංකුව විසින් 2024 වසරේ සිව්වන කාර්තුවට සහ 2025 වසරේ පළමු කාර්තුවට ද අදාළ වන ඒ හා සමාන වාර්තාවක් ඉදිරිපත් කෙරෙනු ඇත. 2025 වසරේ මාර්තු මාසයේ සිට අවධමනකාරී තත්ත්වය ලිහිල් වීමට පටන් ගෙන ඇති බව නිරීක්ෂණය කරන අතර ම, පුරෝකථනයන්ට එළඹීමේ දී භාවිතා කරන ලද දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මගින් නිරූපණය වන ආර්ථික තත්ත්වයන්හි සැලකිය යුතු අපගමනයන් සිදුනොවේ නම්,

නවතම පුරෝකථනයන්ට අනුව, පවතින අවධමනය තාවකාලික වනු ඇති බවත්, 2025 වසරේ තෙවන කාර්තුව වන විට උද්ධමනය ඉලක්කයේ සිට ප්‍රතිශතාංක ± 2 තුළට නැවත පැමිණෙනු ඇති බවත් මහ බැංකුව අපේක්ෂා කරයි.

### උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීම සහ වගවීමේ පියවර සම්බන්ධයෙන් ගෝලීය අත්දැකීම්

උද්ධමන ඉලක්ක කඩවීම් සම්බන්ධයෙන් වන වගවීමේ පියවර පිළිබඳ උදාහරණ ලොව පුරා විවිධ මහ බැංකු අතර නිරීක්ෂණය කළ හැකිය. 1998 එංගලන්ත මහ බැංකු පනතේ නියම කර ඇති පරිදි, එංගලන්ත මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති කමිටුව සඳහා වන කාර්යභාරය අනුව, උද්ධමන ඉලක්කයේ සිට ඉහළට හෝ පහළට 1%කට වඩා උද්ධමනය වෙනස් වුවහොත්, අධිපතිවරයා විසින් භාණ්ඩාගාරයේ චාන්සලර්වරයා වෙත ලිපියක් යැවිය යුතුය. 2022 වසරේ දී රුසියානු-යුක්රේන ගැටුම සහ බලශක්ති මිල ඉහළ යෑම හේතුවෙන් එක්සත් රාජධානියේ උද්ධමනය 10% ඉක්මවා ගිය අතර, ඒ හේතුවෙන් අධිපතිවරයා සහ චාන්සලර්වරයා අතර සන්නිවේදන කිහිපයක් සිදු විය. ඒ හා සමානව, 2021 නවසීලන්ත සංචිත බැංකු පනත මගින් මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශන නිතිපතා ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වන අතර, මුදල් ප්‍රතිපත්ති කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි, උද්ධමන අපගමනයන් සඳහා හේතු පැහැදිලි කිරීම අවශ්‍ය වේ. 2022 වසරේ දී උද්ධමනය 7%ක් ඉක්මවා සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළ විට, නවසීලන්ත සංචිත බැංකුව විසින් උද්ධමන ප්‍රවණතා, ඉලක්කයෙන් අපගමනය වීම් සහ ප්‍රතිපත්ති ප්‍රතිචාර එහි මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශනවල පැහැදිලි කරන ලදී. 1934 ඉන්දියානු සංචිත බැංකු පනතට (2016 වසරේ සංශෝධිත) අනුව, උද්ධමනය අඛණ්ඩව කාර්තු තුනක් ඉලක්කගත පරාසයෙන් පිටත පැවතුනහොත්, මහ බැංකුව විසින් රජයට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ගෝලීය උද්ධමනය ඉහළ යෑමත් සමඟ 2022 වසරේ දී ඉන්දියාවේ උද්ධමනය, උද්ධමන ඉලක්කය ඉක්මවා ගියේය. මේ හේතුවෙන් ඉන්දීය සංචිත බැංකුව හේතු පැහැදිලි කරමින් සහ නිවැරදි කිරීමේ පියවර ගෙන හැර දක්වමින් රජයට වාර්තාවක් ඉදිරිපත් කළේය. උද්ධමන කඩවීම් සඳහා හේතු දැක්වීම නීත්‍යානුකූලව අවශ්‍ය නොවුවත්, ෆෙඩරල් සංචිත බැංකුව එහි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳව කොංග්‍රසයට නිතිපතා වාර්තා කරයි. මෙවන් වගවීමේ පියවර විනිවිදභාවය සහතික කිරීම සඳහා පමණක් නොව, උද්ධමනය පාලනය කිරීමට මහ බැංකු මගින් ගනු ලබන ප්‍රයත්න කෙරෙහි විශ්වාසය ද ඉහළ නංවයි.

### සමාප්ති සටහන්

මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී වගවීම අත්‍යවශ්‍ය වේ. උද්ධමනය සඳහා පැහැදිලි ඉලක්ක ස්ථාපිත කිරීම, අපගමන පිළිබඳ පැහැදිලි කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මගින්, මහ බැංකුවලට සිය විශ්වසනීයත්වය ඉහළ නැංවීම හරහා මිල ස්ථායීතාව පවත්වා ගැනීමටත්, ආර්ථික වර්ධනයට සහාය වීමටත් හැකිය. බාහිර කම්පන හෝ අභ්‍යන්තර වැරදි ප්‍රතිපත්ති යන කවරක් සමඟ කටයුතු කිරීමට සිදු වුවත්, මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සහතික කිරීම සඳහා මහ බැංකු විනිවිදභාවයෙන් හා ප්‍රතිචාරශීලීව කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකාවේ මැදි කාලීන උද්ධමන අපේක්ෂා 5%ක ඉලක්කය සමඟ බොහෝ දුරට අනුකූල වන අතර, එය මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි ආර්ථික පාර්ශ්වකරුවන් අතර ඇති විශ්වාසය පිළිබිඹු කරයි. අර්ධ වාර්ෂික මුදල් ප්‍රතිපත්ති වාර්තා ප්‍රකාශයට පත් කිරීම වැනි සන්නිවේදන උපාය මාර්ග සහ මහ බැංකු පනතෙහි ඇති වගවීමේ ක්‍රියාමාර්ග එවැනි මහජන විශ්වාසයක් ඇති කිරීම සඳහා බෙහෙවින් සහාය වී ඇත.

**මූලාශ්‍ර**

1. Adrian, T. and Khan, A. (2019) 'Central Bank Accountability, Independence, and Transparency', *IMF Blog*, 25 November. Available at: https://meetings.imf.org/en/IMF/Home/Blogs (Accessed 30 March 2025).
2. Bank of Canada. (2008) *Monetary Policy Report Summary - October 2008.*
3. Goodhart, C.A.E. (2010) 'The Changing Role of Central Banks', *BIS Working Papers No. 326*, Bank for International Settlments.
4. Mishkin, F.S. (1997) 'Strategies for Controlling Inflation', In Lowe, P. (ed.), *Monetary Policy and Inflation Targeting, 21-22 July 1997, Kirribilli*. Sydney: Reserve Bank of Australia, pp. 7-38.
5. Reserve Bank of New Zealand. (2011) *Monetary Policy Statement - March 2011*.
6. Rusnok, J. (2018) 'Two Decades of Inflation Targeting in the Czech Republic', *Finance a Uver*, 68(6), pp.514-517.

නම්‍යශීලී විනිමය අනුපාතිකයක් ආර්ථිකයේ කම්පන අවශෝෂකයක් ලෙස ක්‍රියා කරන අතර අවසානයේ ගෙවුම් තුලනයේ ගැළපීම් හරහා විදේශීය අංශයේ ස්ථාවරත්වය සුරක්ෂිත කරයි. විනිමය අනුපාතිකය පෙර තීරණය කළ මට්ටමක පවත්වා ගැනීමේ අවශ්‍යතාවයකට සීමා නොවී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි ස්වාධීනත්වයක් ද මහ බැංකුවට එමගින් සැපයේ. විදේශ විනිමය වෙළඳපොළ ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය (FX Global Code) සම්මත කරගැනීම මගින් වෙළඳපොළ විශ්වසනීයත්වය වැඩි දියුණු වී වෙළඳපොළ භාවිතයන් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල කරන ලද අතර, 2025 වසරේ මාර්තු මාසය වන විට විදේශ විනිමය ගනුදෙනු ගැළපුම් වේදිකාව (FX matching platform) ක්‍රියාත්මක කිරීම මගින් වෙළඳපොළ පුළුල් බව සහ විනිවිදභාවය වැඩිදියුණු වී, මහ බැංකුවේ නියාමන අධීක්ෂණය ශක්තිමත් කෙරුණි. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි මිල අනාවරණ ක්‍රියාවලියට හිතකර ප්‍රතිපත්තියක් සහ මෙහෙයුම් රාමුවක් මගින් විනිමය අනුපාතිකය බොහෝ දුරට වෙළඳපොළ මූලිකාංග පිළිබිඹු